# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට ආධුනිකයින් ඇතුළත් කර ගැනීම - 2023 වර්ෂය

රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට 2023 වර්ෂය සඳහා ආධුනිකයින්/ආධුනිකාවන් ඇතුළත් කර ගැනීම පිණිස මෙහි දෙවන ඡේදයේ සඳහන් අවම සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අවම සුදුසුකම් :-

(අ) වයස :-2023.07.14 දිනට අවුරුදු 16ත් 25ත් අතර විය යුතුය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :-
සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයයන් 06ක්, ඕනෑම විෂයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී අ. පො. ස. (සා.පෙළ) විභාගය සමත්වීම.

03. පුහුණු පාඨමාලා :

ආධුනික පුහුණුවට තෝරා ගනු ලබන ආධුනිකයින්ට පහත සඳහන් වෘත්තීන් හා එම වෘත්තීන්ට අදාළ කාලසීමාවට යටත් ව පාඨමාලාව හැදෑරීමට ඉඩ සලසනු ලැබේ. පාඨමාලාව පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි. පහත සඳහන් පාඨමාලා සඳහා ආධුනිකයින් 25 දෙනා බැගින් තෝරා ගනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පී | - | අවුරුදු 03 (N. V. Q. Level 04) |
| (ii) | පෑස්සුම් ශිල්පී | - | අවුරුදු 03 (N. V. Q. Level 04) |
| (iii) | විදුලි ශිල්පී (බල) | - | අවුරුදු 03 (N. V. Q. Level 04) |
| (iv) | යන්ත්‍ර ශිල්පී (සාමාන්‍ය) | - | අවුරුදු 03 (N. V. Q. Level 04) |

04. අයදුම්පත් :-

අයදුම්කරුවන් විසින් මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව මි. මී. 297 x 210 (A - 4) ප්‍රමාණයේ සුදු කඩදාසියක පිළියෙල කරගත් අයදුම්පත්වල සම්පූර්ණ විස්තර නිවැරදිව සඳහන් කළ යුතුය. අවශ්‍ය සම්පූර්ණ තොරතුරු සඳහන් නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. පාඨමාලා සඳහා තෝරා ගැනීම :-

(1) ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ මඟින් සිදුකරන අතර, අවශ්‍ය අවම සුදුසුකම් ඇති හා 07 වන ඡේදයේ සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(2) ලිඛිත පරීක්ෂණය ගණිතය, මූලික කාර්මික දැනුම හා සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය පදනම් කරගෙන පැවැත්වේ. ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලැබූ අයදුම්කරුවන් ප්‍රායෝගික/සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

(3) ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණවල දී වැඩිම මුළු ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් ඒ ඒ පාඨමාලා සඳහා තෝරා ගනු ලැබේ.

06. විභාග මාධ්‍ය :-ඉල්ලුම් කිරීම අනුව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

07. විභාග ගාස්තු :

මෙම විභාගය සඳහා ආපසු නොගෙවනු ලබන රු. 1,000 ක විභාග ගාස්තුවක් අය කෙරේ. දුම්රිය සාමාන්‍යාධිකාරීගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-1001-2-9027313 ට බැරවෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් ලදුපත අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය. (ලදුපතේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) ලදුපත අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුළත් වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසියම් හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු නොගෙවන බව සැලකිය යුතුය.

08. විභාග මධ්‍යස්ථාන :

සියලුම අවශ්‍යතා සම්පූර්ණ කරන අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක් කොළඹ මධ්‍යස්ථානයක දී පමණක් පැවැත් වේ.

09. ගිවිසුම අත්සන් කිරීම :-
ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් වෘත්තියට අදාළ කාල සීමාවන් තුළ පුහුණුව සාර්ථකව හදාරන බවට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමකට අත්සන් තැබිය යුතුය.

10. පුහුණුවෙන් පසු ආධුනිකයින්ට රැකියා ලබා දීමට දෙපාර්තමේන්තුව බැඳී නැත.

11. පහත දක්වෙන ආදර්ශ අයදුම්පත් පෝරමය අනුව අයදුම්පත් පිළියෙල කර ''නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු හා මානව සම්පත් සංවර්ධන), ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය, කල්දේමුල්ල පාර, රත්මලාන.'' වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ ''ශ්‍රී ලං. ජ. දු. කා. අ. ම. /2023'' යනුවෙන් සඳහන් කළ යුතුය.

12. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය :
අයදුම්පත් **2023.07.14** වැනි දින තෙක් භාරගනු ලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩබ්. ඒ. ඩී. එස්. ගුණසිංහ,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2023 ජුනි මස 06 වැනි දින,
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
කොළඹ 10.

## ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට ආධුනිකයින් බඳවා ගැනීම - 2023

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

01. නම සම්පූර්ණයෙන් (වාසගම සමඟ) සිංහලෙන් හා ඉංග්‍රීසියෙන් ලියන්න. :
සිංහලෙන් :..........................................................................................
ඉංග්‍රීසියෙන් :.......................................................................................

02. ලිපිනය :
(සිංහලෙන්) :.......................................................................................
(ඉංග්‍රීසියෙන්) :....................................................................................

03. දිස්ත්‍රික්කය :................................

04. උපන්දිනය : [ | | | ] [ | ] [ | ] ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | ]

05. ස්ත්‍රී/පුරුෂ භාවය :———.

06. දුරකථන අංකය :———. වට්ස් ඇප් අංකය (Whatsapp) :———.
විද්‍යුත් ලිපිනය (E-mail address) :———.

07. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා/පෙළ) :

වර්ෂය :———. විභාග අංකය :———.

| අනු අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

08. අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති භාෂා මාධ්‍ය :———.

09. විභාග ගාස්තු ගෙවන ලද ලදුපත මෙහි නොගැලවෙන සේ අයදුම්පතට අමුණන්න.

10. ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි. මෙහි සහතික කරන ලද විස්තරවලින් යමක් අසත්‍ය බව මා තෝරා ගැනීමට කලින් පෙනී ගියහොත් එයින් නුසුදුස්සකු වීමටත් තෝරා ගැනීමෙන් පසු පෙනී ගියහොත් පුහුණුවෙන් ඉවත් කර දමනු ලැබීමටත් හැකිවන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

06-253